# கோவிட் - 19 பரவல் தடுப்புக்கான தேசிய செயல்பாட்டு மையம்

**NATIONAL OPERATIONS CENTRE FOR PREVENTION OF COVID - 19**

සිනෝ ලංකා ටවර්, අංක **1090,** ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය

---

නිවේදන අංක **34 :2021**
නිකුත් කරන ලද වේලාව **: 0600**

අධ්‍යක්ෂ ජෙනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
අංක **163,**
කිරුළපන මාවත,
කොළඹ **05**

**2021** පෙබරවාරි මස **03** වන දින

<u>මාධ්‍ය ප්‍රචාර ලබා ගැනීම</u>

කොවිඩ්-**19** පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය වෙතින් අද **(03)** දින ඉදිරිපත් කරනු ලබන තොරතුරු පහත සඳහන් වන අතර, එම තොරතුරු මාධ්‍ය නිවේදනයක් ලෙස මහජනතාව වෙත නිකුත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

අද **(03)** දින උදෑසන වනවිට ශ්‍රී ලංකාවෙන් කොවිඩ් - **19** ආසාදිත පුද්ගලයින් **715** දෙනෙකු හඳුනාගෙන ඇත. එම පුද්ගලයින් සියලුදෙනා දේශීයව හඳුනාගත් පුද්ගලයින් ලෙස වාර්ථා වේ. හඳුනාගත් ආසාදිතයින් අතරින් වැඩිම ආසාදිතයින් පිරිසක් කොළඹ දිස්ත්‍රික්කයෙන් වාර්ථා වන අතර, ඒ ආසාදිතයින් **261** ක් ලෙසය. ඊට අමතරව, ගම්පහ දිස්ත්‍රික්කයෙන් ආසාදිතයින් **142** ක් සහ බදුල්ල දිස්ත්‍රික්කයෙන් ආසාදිතයින් **61** ක් ලෙස වාර්ථා වේ. අනෙක් ආසාදිතයින් **464** දෙනා දිවයිනේ සෙසු දිස්ත්‍රික්ක වලින් වාර්තා වේ.

අද **(03)** දින උදෑසන වනවිට, මිනුවන්ගොඩ බ්‍රැන්ඩික්ස් පොකුරට සහ පැලියගොඩ මත්ස්‍ය වෙළඳපලට සම්බන්ධ පොකුරෙන් වාර්තා වූ කොවිඩ් - **19** වෛරසය ආසාදිත සම්පූර්ණ පුද්ගලයින් සංඛ්‍යාව **61,710** ක් වේ. ඉන් පුද්ගලයින් **56,945** දෙනෙකු මේ වනවිට පූර්ණ සුවය ලබා රෝහල්වලින් බැහැරව ගොස් ඇත.

කොළඹ මත්ස්‍ය වෙළඳපලේ පොකුර - **58,651**

අද **(03)** දින උදෑසන වනවිට, ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-**19** වෛරසය ආසාදනය වූ සම්පූර්ණ ආසාදිතයින් සංඛ්‍යාව **65,697** ක් වන අතර ඉන් පුද්ගලයින් **59,042** ක් පූර්ණ සුවය ලබා රෝහල්වලින් බැහැරව ගොස් ඇත. අද **(03)** දින උදෑසන වනවිට, රෝහල්ගතව සහ අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන තුළ ආසාදිතයින් **6,325** දෙනෙකු තවදුරටත් ප්‍රතිකාර ලබයි.

අද **(03)** දින උදෑසන **0600** වනවිට (පසුගිය පැය **24** තුළ) රෝහල්ගතව සහ අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන තුළින් පුද්ගලයින් **968** ක් පූර්ණ සුවය ලබා පිටව ගොස් ඇත.

අද **(03)** දින උදෑසන වනවිට (පසුගිය පැය **24** තුළ) ශ්‍රී ලංකාව තුළින් කොවිඩ්-**19** වෛරසය ආසාදනය වී පුද්ගලයින් **07** දෙනෙකු මියගොස් ඇත. ඔවුන් පොලොන්නරුව, වත්තල, කොළඹ **02,** උඩුගම්පොල, නුගේගොඩ, මැදවල සහ ගෙලිඔය යන ප්‍රදේශයින්හී පදිංචි පුද්ගලයින් ලෙස වාර්තා වේ. ඒ අනුව, අද **(03)** දින උදෑසන වනවිට ශ්‍රී ලංකාව තුළින් කොවිඩ් - **19** ආසාදිත සම්පූර්ණ මරණ සංඛ්‍යාව **330** ක් දක්වා ඉහළ ගොස් ඇත.

අද **(03)** දිනයේදී ත්‍රිවිධ හමුදාව මගින් පාලනය කරනු ලබන නිරෝධායන මධ්‍යස්ථාන **93** ක් තුළ පුද්ගලයින් **7,406** දෙනෙකු නිරෝධායනය වෙමින් සිටියි.

ඊයේ **(02)** දිනය තුල **PCR** පරීක්ෂණ **12,340** ක් සිදුකර ඇත.